Institute of Indigenous Medicine
04 JUN 2019
University of Colombo

**කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය**

**05 වන බී. ඒ. එම්. එස්. සිව්වන විශේෂ අතිරේක පරීක්ෂණය - 2019 මැයි**

**ස්ත්‍රී රෝග**

11

කාලය - පැය 03

ප.ව. 1.00 - ප.ව. 4.00

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01.

I. වන්ද්‍යාභාවය පිළිබඳ ආයුර්වේද මතය පැහැදිලි කරන්න. (ලකුණු 06)

II. කාන්තාවක් විවාහ වී වසර 08 ක ගත වුවද ඇයට තවමත් දරු පිළිසිඳ ගැනීමක් සිදු වී නොමැත. ඇයගේ ස්වාමි පුරුෂයාගේ ඉතාම නීරෝගී ශුක්‍රාණු පවතින බවට වාර්තා වී ඇති අතර, ඇයගේ ඔසප් චක්‍රයද ක්‍රමික බව ඇය පවසයි. මෙම කාන්තාවට දරුඵල ලබා දීමට ඔබ අනුගමනය කරන වෛද්‍ය පරීක්ෂා, ප්‍රතිකාර පද්ධතිය දක්වා, එහි යුක්ති යුක්ත භාවය පහදන්න.

(ලකුණු 14)

02.

I. ආයුර්වේදීයව ආර්තව චක්‍රය පහදන්න. (ලකුණු 05)

II. ශුද්ධ ආර්තවයේ ලක්ෂණ දක්වන්න. (ලකුණු 05)

III. ආර්තවයේ දූෂණය විමෙන් හටගන්නා රෝග අවස්ථා පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 10)

03.

I. විවිධ ආචාර්ය මත අනුව යෝනි ව්‍යාපත් වර්ගීකරණය දක්වන්න. (ලකුණු 05)

II. පහත දැක්වෙන යෝනි ව්‍යාපත් අවස්ථා විස්තර කර,ඒවායේ චිකිත්සාව සඳහා යොදා ගත හැකි බාහිර ප්‍රතිකාර 2 ක් සහ අභ්‍යන්තර ඖෂධ 3 ක් බැගින් දක්වන්න.

- ශ්ලේෂ්මලා යෝනි ව්‍යාපත් (ලකුණු 05)
- වාතලා යෝනි ව්‍යාපත් (ලකුණු 05)
- ප්‍රස්‍රංසිනී යෝනි ව්‍යාපත් (ලකුණු 05)

04. අවු. 32 ක විවාහක කාන්තාවක් මාස් විමේදී අධිකව රුධිරය පිටවන බවත්, වේදනාව ඇති බවත් පැමිණිලි කරයි. ඇය සඳහා විවිධ රෝග විනිර්ණය දක්වා රෝග විනිශ්චයට එළඹෙන අයුරු දක්වන්න. ඒ සඳහා ඔබ යොදනා චිකිත්සාව අභ්‍යන්තර ඖෂධ, බාහිර ප්‍රතිකාර හා පථ්‍යා පථ්‍ය සමඟින් දක්වන්න.

(ලකුණු 20)

05. කෙටි සටහන් ලියන්න

I. ස්ත්‍රී වයස් විවරණය
II. ගර්භාශගත අර්බුද
III. යෝනි කන්ද
IV. සෝම රෝග

(ලකුණු05 x4= 20)

2019.06.04